අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 · +94112784846
isurupaya@moe.gov.lk · www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. : ED/03/56/03/03

ඔබේ යොමුව / உமது இல. / Your Ref. :

දිනය / திகதி / Date : 2022.05. 26

සියලු ම විදුහල්පතිවරුන් වෙත,

**<u>'පාසල් පර්යේෂණ සතිය' වැඩසටහන</u>**

උක්ත කරුණට අදාළ මාගේ සමාංක හා 2022.05.05 දිනැති ලිපිය හා බැඳේ.

02. එකී ලිපියෙන් දැනුම් දුන් පරිදි 'පාසල් පර්යේෂණ සතිය' වැඩසටහන, 2022 මැයි මස 17 සිට 20 දක්වා පැවැත්වීමට නියමිතව තිබුණ ද එම සතිය තුළ අදාළ වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වූයේ නම්, නැවත පාසල් ආරම්භ වන ජූනි මස 6 වන දායින් එළඹෙන සතිය (ජූනි 6 සිට ජූනි 10) තුළ මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන මෙන් කාරුණික ව දන්වමි.

03. තව ද, යොමුගත ලිපියෙහි දක්වා ඇති තෙවන කාණ්ඩය සඳහා එනම්, ජ්‍යෙෂ්ඨ ද්විතීයික අංශයට අදාළ වැඩසටහන වන 'පර්යේෂණ ව්‍යාපෘතියක් ක්‍රියාවට නැංවීම' සම්බන්ධයෙන් සිසුන් දැනුම්වත් කිරීමේ වැඩසටහනක් 2022 මැයි 24 වන දින මාර්ගගතව සිදු කරන ලදි. එම මාර්ගගත දැනුම්වත් කිරීමේ වැඩසටහනේ වීඩියෝව සහ අදාළ ඉදිරිපත් කිරීම්වල මෘදුපිටපත් මෙන් ම වැඩසටහන පිළිබඳ සියලු තොරතුරු අධ්‍යාපන අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියේ (www.moe.gov.lk) විශේෂ නිවේදන (Special Notices) යටතේ පළ කර ඇති අතර මෙම සියලු තොරතුරු පළාත් හා කලාප පර්යේෂණ සම්බන්ධීකරණ නිලධාරීන් වෙත ද විද්‍යුත් තැපැල් හා Whatsapp සමූහය මගින් යොමු කරනු ඇත.

04. උක්ත මාර්ගගත දැනුම්වත් කිරීමේ වැඩසටහන සඳහා සහභාගි වූ සිසු සිසුවියන්ගේ සහ ගුරුභවතුන්ගේ ඉල්ලීම පරිදි සහ පාසල් නැවත ආරම්භ කිරීමේ දිනය ද සැලකිල්ලට ගනිමින් පර්යේෂණ යෝජනාවලි භාරදීමේ අවසන් දින පහත පරිදි සංශෝධනය කරන බව වැඩිදුරටත් කාරුණික ව දන්වමි.

- පාසල් මට්ටමින් පර්යේෂණ යෝජනාවලි භාරදිය යුතු අවසන් දිනය - 2022 ජූනි 13
- කලාප මට්ටමින් පර්යේෂණ යෝජනාවලි භාරදිය යුතු අවසන් දිනය - 2022 ජූනි 23
- පළාත් මට්ටමින් පර්යේෂණ යෝජනාවලි ඉදිරිපත් කළ යුතු අවසන් දිනය **<u>නොවෙනස්</u>** ව පවතී (2022 ජූනි 30).

05. තව ද, පර්යේෂණ යෝජනාවලි සකස් කිරීම සඳහා වැඩිදුර සහාය අවශ්‍ය වන්නේ නම්, කලාප හා පළාත් පර්යේෂණ විෂයභාර නිලධාරීන් මගින් මෙම ශාඛාවට දැනුම් දෙන ලෙස දන්වන අතර මෙම වැඩසටහන සාර්ථක කර ගැනීම සඳහා ඔබෙන් ලැබෙන සහයෝගය අතිශයින් අගය කරමි. (පළාත් හා කලාප පර්යේෂණ සම්බන්ධීකරණ නිලධාරීන් සම්බන්ධ කර ගත හැකි දුරකථන අංක ඇතුළත් ලේඛනය මෙහි ඇමුණුම් අංක 01 මගින් ද, පාසල් හා කලාප මට්ටමේ ඇගයීම් සිදු කිරීමෙන් අනතුරු ව සිසුන් වෙත ලබාදිය යුතු සහතික පත්‍රයට අදාළ ආකෘතිය ඇමුණුම් අංක 02 මගින් ද ඉදිරිපත් කරමි)

**උදාරා ඩී. දික්කුඹුර**
අධ්‍යාපන අධ්‍යක්ෂ (පර්යේෂණ හා සංවර්ධන)
අධ්‍යාපන ලේකම් වෙනුවට

පිටපත්:
1. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ - කරු. දැ.ගැ.ස.
2. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ - කරු. දැ.ගැ.ස.
3. පළාත් / කලාප පර්යේෂණ සම්බන්ධීකරණ නිලධාරී - කරු. දැ.ගැ.ස. හා අ.ක.ස.